# ප්‍රශංසා එකතු සුපුවත

2017 ජූලි මස 03 වන දින සිට ජූලි මස 09 වන දින දක්වා

**" ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීමේ පංගුකාරයන් වීම දේව ආශිර්වාදයකි. ඉමහත් භාග්‍යයකි "**

01 ප්‍රශංසාව සඳහා යොමුව:

i * මෙලොව ජීවිතයේ දුක, වේදනා හා විපත් තේරීමක් නොමැතිව යහපත්, අයහපත් සෑම කෙනෙකුටම පැමිණේ එය ජීවිත යථාර්ථයකි. අයහපත හා දුක වේදනාව අතර සබඳතාවයක් ඇත. එසේම යහපත හා දුක, වේදනා සහ විපත් අතර සබඳතාවයක් ඇත. මෙය අභිරහසකි. මිනිස් බුද්ධියෙන්, තර්කයෙන් තේරුම් ගත නොහැක.

* එහෙත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය කරණ කොට ගෙන, දමිටු අය දුක් විඳීම භාග්‍ය සම්පන්න අත්දැකීමක් බවට හැරවූ සේක.

* එහෙයින් ශුද්ධවූ කැමැත්ත ඉටු කරන්නට කැඳවූ අප මෙම වසරේ ශුද්ධාත්ම ආගමන මංගල මහෝත්සවයේදී ලද මෙම මහඟු දේව අනුග්‍රහය මුල් කරගෙන තුති ප්‍රශංසා කරමු.

ii පුබුදු ගී අංක 156 "කපාල හෙළ තෙක්....."

02. දවසේ සුපුවත :

i ජෝබ් 3:1-4 **"මා උපන් දිනයට සාප වේවා! මා වැනි පිරිමි දරුවෙකු පිළිසිඳ ගත් රාත්‍රියට සාප වේවා ! ......"**

* ඉහත සඳහන් පාඨය කියවා ජෝබ් මෙසේ තමාගේ උපන් දිනයට ශාප කළේ මන්දැයි සාකච්ඡා කරන්න.

* ඔහුට විඳින්නට සිදු වූ දරුණුම දුක, වේදනාවන් තුළ මෙසේ අධෛර්ය සම්පන්න වුවත් සමිඳාණන් වහන්සේ කෙරෙහි වූ ඇදහීම මුල් කරගෙන, ඔහු දැරූ දුක වේදනාව තුළ අවසාන අත්දැකීම කුමක් වීද?
පහත සඳහන් ශු.ලියවිලි පාඨය කියවා නැවත සාකච්ඡා කරන්න.

ii ජෝබ් 42:1-6 **" කලින් මා ඔබ ගැන කනින් අසා තිබුණේ ය. එහෙත්, දැන් මාගේම දෙනෙතින් මම ඔබ දැක ගතිමි. එබැවින් මම මා ගැනම ලජ්ජා වෙමි...."**

iii සාකච්ඡාව තුළ බෙදා ගත් දෑ කීපයක් පොදුවේ බෙදා ගන්න.

03. වචනයේ සේවකයා සඳහා :

i ක්‍රියා 5:41 **"එවිට ප්‍රේරිතයෝ ඒ නාමය උදෙසා නින්දා විඳීමේ භාග්‍යය ගැන ප්‍රීති වෙමින්, මන්ත්‍රණ සභාවෙන් ඉවත්ව ගියහ."**

* ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් වෙත වැඩම කරන්නට පෙර ඔවුන් තුළ තිබූ ස්වභාවය දැන් සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇත. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමය උදෙසා එනම් සුභ අස්නට සාක්ෂි දරන්නට ඔවුන් තුළ වූයේ අධිකතර පිපාසයකි. සමිඳාණන් වහන්සේගේ ශුද්ධවූ අභිප්‍රාය ඉටු කරන්නට යෑමේදී ඔවුන්ට මුහුණ දෙන්නට සිදු වූ නින්දා අපහාස නිසා ඔවුහු ප්‍රීති වූහ. කෙතරම් දරුණු පීඩා, උවදුරු, අභියෝග පැමිණියද ඔවුන් එඩිතර වුනා. මන්ද දේව කැමැත්ත මුළු මනින් ඉටු කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන්ට බලයද, ශක්තිය ද ප්‍රධානය කළ සේක. ඔවුන් වහන්සේ මෙම දුබල ශ්‍රාවකයන් සමග වැඩහුන් සේක.

04. අප දෙස:

* ශුද්ධවූ කැමැත්ත ඉටු කිරීමේදී පවුල තුළ, සංඝය හා සමාජය තුළ අපට පුබුදු ජනතාවක් ලෙස මුහුණ දෙන්නට සිදුවන දුක් පීඩා බොහෝය. එහෙත් මනුෂ්‍ය ශක්තියෙන් ඊට මුහුණ දීමට නොහැක. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ අවදිවීමේ ජීවිතයක් ගත කරමු

නම්... ඔවුන් වහන්සේ අප බලවත් කරන සේක.

05. සතිය පුරා මෙනෙහි කර බලමු. (රානි අම්මාගේ අත්දැකීම ඇසුරෙන්)
   * සමිඳාණන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය කෙතරම් පවිත්‍රද? ඍජුද?
   * සියල්ලේදී ඔවුන් වහන්සේ මා/අප ළඟ බව අත්දකින්නේ ද?

06. අවසාන ප්‍රශංසාව - පුබුදු ගී අංක 156 "කපාල හෙළ තෙක්....."

=======================

## ප්‍රශංසා එකතු සුපුවත

2017 ජූලි මස 10 වන දින සිට ජූලි මස 16 වන දින දක්වා

**" සමිඳාණන් වහන්සේ ඔබට කියන කොයි දෙයක් වුවද කරන්න "**

01 ප්‍රශංසාව සඳහා යොමුව:

i * මිනිස් අප සමිඳාණන් වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමය අප ජීවිත තුළ අත්විඳින ප්‍රමාණයට අපි ඔවුන් වහන්සේ තුළ ජීවත් වෙමු. එසේම අන් අයට ශුද්ධවූ ප්‍රේමය දානය කරන්නන් වෙමු. දේව ආදරයෙන් තොරව අපගේ මිනිස් වැඩ කටයුතු, ක්‍රියාවන් මෙන්ම සේවාවන් වනාහි ඒ ඒ අවස්ථාවන්වල මතුවන අවශ්‍යතාවයන්ට පිළිතුරු සැපයීමක් පමණි.
  * මෙම තත්ත්වය පවුල, සංඝය හා සමාජයේ වැඩ කටයුතු වලටද අදාළය.
  * ක්‍රියා 1:8 **"ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල ඔබ බලය ලබන්නහුය. එවිට....... පොළොවේ සීමාන්තයන් දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහුය.."**

ii පුබුදු ගී අංක 150 "ඔබෙන් තොරව මහ පොළොව පවා...."

02. දවසේ සුපුවත :

i රෝම 9:16-17 **"එහෙයින් සියල්ල රඳා ඇත්තේ මිනිසාගේ කැමැත්ත පිටවත්, ශ්‍රමය පිටවත් නොව, දෙවියන් වහන්සේගේ දයානුකම්පාව පිට ය. මන්ද මා නුඹ පත් කළේ හුදෙක් නුඹ කරණ කොට ගෙන මාගේ බලය පා මාගේ නාමය ලොව පුරා ප්‍රකාශ කරන පිණිසය. "**

  * ඉහත ශු. ලියවිලි පාඨය කියවා, අප වෙනුවෙන් මිනිසත් බව ගෙන, අප අතර වැඩ විසූ ක්‍රිස්තුන් වහන්සේ තම පියාණන්ගේ ශු.කැමැත්ත ඉටු කිරීමට තිබූ පිපාසය පිළිබඳව බෙදා ගන්න.
  * පුබුදු ජනතාවක් හැටියට පවුල තුළ, සංඝය තුළ, සමාජය තුළ ශුද්ධවූ කැමැත්ත ඉටු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න.
  * පුබුදු ජනතාවක් හැටියට අපගේ දූත කාර්යය හා එසේ දේව කැමැත්ත පරිදි ඉටු කිරීමට අපොහොසත් වූ සැටිද බෙදා ගන්න.

ii පොදුවේ අත්දැකීම් කීපයක් බෙදා ගෙන මනස්ථාපනයකට යොමු වන්න.
   පුබුදු ගී අංක 33 "මගෙ සිත බිඳිනට ......"

03. වචනයේ සේවකයා සඳහා :
  * සතුන් සහජ බුද්ධියේ හැටියට ක්‍රියා කරති. එහෙත් මිනිසාට පමණක් නිදහස් කැමැත්තක් තිබේ. එසේ නම් කිතුනු ශ්‍රාවකයන් වන අප අපගේ නිදහස් කැමැත්තෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේගේ පූර්ණ අනුග්‍රය තුළ ශුද්ධවූ කැමැත්ත ඉදිරියේ 'ආමෙන්' කිව යුතුය. මන්ද සමිඳාණන් වහන්සේගේ ප්‍රේමයේ ස්වරූපයට අප මවා ඇති බැවිනි.

* රෝම 15:1-6 **"ඇදහිල්ලෙහි ශක්තිමත් වූ අපි, අප ගැනම නොසිතා ඇදහිල්ලෙහි දුර්වල වූවන්ගේ ප්‍රමාද දෝෂ ඉවසීමෙන් දරා ගනිමු. අප එකෙකා තම අසල්වැසියාගේ ශුභ සිද්ධිය සලසන සේ, ඔහුගේ යහපත තකා ඔහු සතුටු කළ යුතුය. ....."**

* ප්‍රේමයාණන් තුළ අපගේ මනුෂ්‍ය කැමැත්ත අත් හරිමින් ශුද්ධවූ කැමැත්ත අපගේ එදිනෙදා ජීවිතය තුළ ඉඩ හරින ප්‍රමාණයට, ශුද්ධවූ කැමැත්ත කරන්නට සා පිපාසා වන තරමට අපට ගැඹුරු ප්‍රීතියක් මෙන්ම සාමයක් භුක්ති විඳීමට පුළුවන.

04. අප දෙසः
   * රන්ජනා අම්මා විසින් තේමා කථාවේදී බෙදා ගන්නා ලද අත්දැකීම. (නව වැසිකිලි පද්ධතියක් සෑදීම සම්බන්ධයෙන් පැන නැඟුණු අසල්වාසී විරුද්ධත්වය) පළමුව ඔබට ලැබුණු ආලෝකය ගැන ළඟ සිටින කෙනා සමඟ කථා කරන්න.

05. අවසාන ප්‍රශංසාව - පුබුදු ගී අංක 150 "ඔබෙන් තොරව මහ පොළොව පවා...."

**************************